# මෙරට රජවරුන්ගේ චර්යාව

අප යථාර්ථවාදය යන්න පසෙකට දමන ප්‍රධාන හේතුව නම් යථාර්ථවාදය යනුවෙන් ප්‍රපංචයක් හෝ වෙනත් යමක් හෝ නොමැතිවීම ය. කෘතියක් යථාර්ථවාදී දැයි දැනගත හැක්කේ යථාර්ථය සමග කෘතිය සංසන්දනය කිරීමෙනි. එහෙත් අප යථාර්ථය දැනගන්නේ කෙසේ ද? යථාර්ථය දැනගත හැක්කේ යම්කිසි ප්‍රවාදයක් ඇසුරෙන් ය. එහෙත් ඒ ප්‍රවාදය මිනිසුන්ගේ නිර්මාණයක් වෙයි. ප්‍රවාදයක් ඇසුරෙන් නොවන්නට යථාර්ථය දැනගන්නේ කෙසේ දැයි කිසිවකු විමසුවහොත් අපට කීමට ඇත්තේ කුමක් ද?

ඊනියා යථාර්ථය ද මිනිසුන්ගේ නිර්මාණයක් වන බැවින් යම්කිසි කලා කෘතියක් යථාර්ථවාදී දැයි ඇසීම තේරුමක් නැති දෙයකි. කව්සිළුමිණ යථාර්ථවාදී ද යන්න තේරුමක් නැති ප්‍රශ්නයක් වනුයේ එබැවිනි. මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර අනුකරණයෙන් කියන යථාර්ථය කුමක් වුවත් කව්සිළුමිණෙහි කියන ආකාරයට ලංකාවේ සිංහල රජවරුන් හැසුරුණේ ද නැත් ද යන්න නම් වැදගත් ප්‍රශ්නයක් වෙයි. ඒ ප්‍රශ්නයට අප පිළිතුරක් දෙන්නේ කෙසේ ද?

අප මෙහි දී තැත්කරන්නේ රජුන් එසේ ක්‍රියාකෙළේ ද නැත් ද යන්න තීරණයකිරීම මිස රජුන් එසේ ක්‍රියාකෙළේ නම් එසේ කෙළේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරක් දීම නො වෙයි. යථාර්ථවාදියා නිතර ම අසන්නේ යමක් සිදුවූයේ ද සිදුවන්නේ ද ආදී ප්‍රශ්න නොව සිදුවූයේ ඇයි ද සිදුවන්නේ ඇයි ද ආදී ගණයේ ප්‍රශ්නය ය. යමක් විස්තරකිරීමේ දී පවා නිර්මාණයක් සිදුකෙරෙයි. අප යමක් අසවල් පාට යැයි කියන්නේ ම නිර්මාණයක් සමගිනි. අප නිරීක්ෂණයක දී වුව ද කරන නිර්මාණයක් නැත්නම් අප කැමරා වැනි හුදු යන්ත්‍ර බවට පත්වෙයි.

විස්තරකිරීම ද නිර්මාණයක් වන නමුත් යම් දෙයක් සිදුවූයේ හෝ සිදුවන්නේ හෝ ඇයි ද යන ප්‍රශ්නයට දෙන පිළිතුර ගණයේ නිර්මාණයක් නො වෙයි. දෙවැනි ගණයේ නිර්මාණ පළමු ගණයේ නිර්මාණවලට වඩා සංකීර්ණ ය. උදාහරණයක් ලෙස පොල් වැටීම යන සංසිද්ධිය ගනිමු. අපි පොල් වැටීම යන්න වෙනත් අයකුට විස්තර කරමු. එහි දී කෙරෙන්නේ පොල් වැටීම යන සංසිද්ධිය විස්තරකිරීම පමණකි. එහි ඇති නිර්මාණය කුමක් දැයි කිසිවකුට සිතෙන්නට හැකි ය. එහෙත් පොල් යන සංකල්පය හා වැටීම යන සංකල්ප අපේ නිර්මාණ වෙයි. පොල් යන සංකල්පයට සිංහල සංස්කෘතියේ ඇති තේරුම (වටිනාකම) කොකනට් (coconut) යන සංකල්පයට ඉංගිරිසින් දෙන වටිනාකමට වඩා වෙනස් ය. වෙනත් ඉන්ද්‍රිය පද්ධතියක් ඇති සත්වයකු පොල් ආශ්‍රිත දෙයට කිනම් වචනයක් (වචන ඇත්නම්), වටිනාකමක් දෙන්නේ දැයි අපි නො දනිමු.

පොල් යන සංකල්පය ම එතරම් සංකීර්ණ නම්, පොල් වැටෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට දෙන පිළිතුර ගැන කිවහැක්කේ කුමක් ද? පොල් වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා යැයි නිව්ටන් පඬිවරයා කීව ද ඒ ගැන එයට වඩා ගැඹුරු පිළිතුරක් අයින්ස්ටයින් විද්වතා දී ඇත. ඔහුට අනුව පොල් වැටීමක් නො සිදුවෙයි. පොල් ගෙඩිය (ගෙඩිය යන්න ද අප විසින් නිර්මාණය කරන ලද තවත් සංකල්පයකි.) අවකාශ කාලයෙහි වක්‍රතාව අනුව භූමිතිකයක් දිගේ චලනය වන්නේ යැයි අයින්ස්ටයින් පඬිවරයා කීවේ ය. ගුරුත්වාකර්ෂණය, අවකාශ කාලය, වක්‍රතාව, භූමිතිකය ආදී සියල්ල මිනිසුන්ගේ නිර්මාණ වෙයි.

ලංකාවේ පැරණි රජවරුන් ගතකල ජීවිත කෙසේ වී දැයි විස්තර කිරීම එකකි. ඔවුන් එසේ ජීවත්වූයේ ඇයි ද යන්න තේරුම් ගැනීම තවත් එකකි. අප මෙහි දී උත්සාහගන්නේ පැරණි රජවරුන් කෙසේ ජීවත් වී දැයි තේරුම්ගැනීමට ය. ඒ සඳහා අප කළයුත්තේ එකල රජුන් ගැන ලියැවී ඇති පතපොත, සෙල්ලිපි ආදිය කියවීම ය. එසේත් නැත්නම් ජනප්‍රවාදයෙහි රජවරුන් ගැන කියැවෙන දේ අධ්‍යයනය කිරීම ය. ඒ සියළු විස්තර සලකාබලා රජවරුන්ගේ ජීවිත ගැන සංගත පිළිතුරක් සකසාගත යුතු වෙයි.

සිංහල රජවරුන් ගැන අපට ලබාගත හැකි තොරතුරු අනුව පැහැදිලිව ම කිවහැක්කේ භාරතයේ මෙන් ඔවුන් අන්ත:පුර පවත්වාගෙන ගොස් නැති බව ය. ඇතැම් රජ කෙනකුට බිසොවුන් කිහිපදෙනකු සිටි බව පැහැදිලි නමුත් සාමාන්‍යයෙන් ගතහොත් විශාල අන්ත:පුර පවත්වාගෙන ගිය බවට සාක්ෂි නැත. නුවර යුගයේ පවා රන්දෝලිය සහ

© Prof. Nalin De Silva

යකඩදෝලිය ගැන කියැවෙන්නේ යකඩදෝලි රාශියක් සිටි අර්ථයකින් නො වෙයි. එමෙන් ම රජවරුන්ගේ කාමභෝගි ජීවිතයක් ගැන කෙරෙන විස්තර අපට සාමාන්‍යයෙන් සොයාගත නො හැකි ය.

මෙහි දී යමකුට කව්සිළුමිණෙහි එසේ සඳහන් නොවන්නේ දැයි ඇසිය හැකි ය. අපේ ප්‍රශ්නය ද එයම ය. කව්සිළුමිණ රචනාකර ඇත්තේ අපේ රජවරුන් ගැන කීමට ද, එසේත් නැත්නම් භාරතයේ රජවරුන් ගැන කීමට ද? අනුරාධපුරයේ මැදභාගයෙන් පසුව අපේ පොතපත සහ සාධාරණ වශයෙන් ගත්කල දැනුම භාරතීය දැනුමෙහි අවශෝෂණ වෙයි. එසේ දැනුම අවශෝෂණයකිරීමේ දී අපේ පැරැන්නන් විසින් යම් යම් දේ එකතුකළා නිසැක ය. එහෙත් හරය වශයෙන් ගත්කල, එනම් මධ්‍යයෙහි යන අරුතින්, එහි ඇත්තේ භාරතීය දැනුම ය.

අපේ පැරැන්නන් ඒ යුගයේ කර ඇත්තේ භාරතීය දැනුම සිංහල බෞද්ධ සංස්කෘතියට අවශෝෂණයකිරීම බව සමස්තයක් ලෙස අපට පෙනී යන කරුණකි. එහෙත් අතරින් පතර අනුකරණ ද නොතිබුණා නො වෙයි. මේ සියල්ල ගැන කල්පනාකර බැලීමේ දී අපට දියහැකි පිළිතුර නම් කව්සිළුමිණ ආකෘතියෙන් මෙන් ම අන්තර්ගතයෙන් ද අවශෝෂණයකට වඩා අනුකරණයක් බව ය. එය උසස් කාව්‍යයක් නොවේ යැයි මෙයින් නොකියැවෙන බව ද අමතක නොකළ යුතු ය. එය පරිවර්තනයක් ද නො වෙයි. එහෙත් එහි අන්තර්ගතයෙන් කියැවෙන්නේ සාමාන්‍යයෙන් මෙරට රජවරු ගතකළ ජීවිතය නො වෙයි.

පසු කලෙක ලියැවුණු සංදේශ කාව්‍ය ද භාරතීය සංදේශ කාව්‍ය දෙස බලා නිර්මාණය කරන ලද්දේ වෙයි. එහෙත් ඒ කාව්‍යවල අන්තර්ගතයෙන් සාමාන්‍යයෙන් කියැවුණේ මෙරට තොරතුරු ය. එහි වර්ණනා කෙරුණේ මෙරට සෞන්දර්ය ය. කාව්‍ය ලෙස ගත්කල සංදේශ කාව්‍ය එකක්වත් කව්සිළුමිණ තරම් උසස් නොවනවා විය හැකි ය. එහෙත් අපට සංදේශ කාව්‍යවලින් මෙරට ඉතිහාසය ගැන යමක් දැනගත හැකි ය. එකල ගම් දනව් ගැන තොරතුරු ලබාගත හැකි ය. කව්සිළුමිණ පමණක් සලකාබැලීමෙන් මෙරට රජවරු අන්තඃපුර පවත්වාගෙන යමින් කාමභෝගී ජීවිත ගතකල බව නිගමනය කළ හැකි නො වෙයි.

අපේ පැරණි රජවරුන් හික්මවනු ලැබුයේ සිංහල ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය මගිනි. මෙරට පැවති එක් අදහසකට අනුව රජවරු බෝසතුන් විය යුතුව තිබුණි. අපේ ඉතිහාසයෙහි අග්බෝ හෙවත් අග්‍රබොධි යන නම ගත්තෝ ම කිහිප දෙනෙක් වූහ. රජවරුන්ට සමස්තයක් ලෙස ගත්කල අනුබල ලැබුණේ දැහැමි දිවි පෙවෙතක් ගෙනයෑමට ය. ඇතැම් රජකු සුරාවට ලොල් වූ බව මහාවංසයෙහි සඳහන් විස්තර අනුව වුවත් අපි දන්නෙමු. එහෙත් ඒ සාමාන්‍යය නොව විශේෂය විය. අපේ ඉතිහාසයෙහි බොහෝ විට ඇත්තේ මවට උපස්ථානකළ ගිලනුන්ට වෙදකම්කළ වෙහෙර විහාර කළ, බණ ඇසූ රජවරුන් ගැන බව අමතක නොකළ යුතු ය.

අප රටේ ඉතිහාසය ගැන කතාකරද්දී බොහෝ දෙනා එක්කෝ භාරතීය ආකෘතිය අනුව යති. එසේත් නැත්නම් බටහිර යුරෝපීය ආකෘතිය අනුව යති. එසේත් නැත්නම් ඒ දෙකෙන් ම අතනින් මෙතනින් ගත් කොටස් එකතුකර අමුතු ම ඉතිහාසයක් ගොඩනගති (නිර්මාණයකරති). අපේ ඉතිහාසයෙහි වැඩවසම් සමාජයක අන්තඃපුර පවත්වාගෙන ගිය රජවරුන් දකින්නේ එලෙස ඉතිහාසය ගොඩනැගීමෙනි. මෙරට රජවරු සියල්ලන් බෝසතුන් ලෙස හඳුනාගැනීමට ද අප උත්සාහ නොකළ යුතු ය. එහෙත් ඔවුන් ඉතා වැඩි ප්‍රමාණයකට ආලෝකය සපයනු ලැබුයේ බෝසත් චරිතයෙන් බව පැහැදිලි ය.

රජවරුන් ද එසේ වූ කල සාමාන්‍ය වැසියන් ගැන කිවහැක්කේ කුමක් ද? සාමාන්‍ය වැසියෝ බහුභාර්යාවන් හා බහුස්වාමිපුරුෂයන් සමග ජීවත්වූවෝ ද? එසේත් නැත්නම් ඔවුහු ඇඳුම් මාරුකරන ආකාරයෙන් භාර්යාවන් හා ස්වාමිපුරුෂයන් මාරුකළෝ ද? ගම් ප්‍රධානීහු ගමේ කාන්තාවන් තම වසඟයට ගත්තෝ ද? බිරිතානි යුගයෙහි විසූ ගම් ප්‍රධානීන් හා බිරිතානීන්ගෙන් වරප්‍රසාද ලත් රටේ මහත්වරු ආදී බිරිතානීන් විසින් ඇතිකරන ලද ප්‍රභූන් කිහිප දෙනකුගේ ජීවිත සලකා බැලීමෙන් පමණක් ඇතැම්හු ඉතිහාසයෙනි සැමදාමත් මෙරට ප්‍රභූන් ගතකල ජීවිත ගැන සාධාරණ වශයෙන් කරුණු කීමට ඉදිරිපත්වෙති. මෙය ද නිවැරදි නො වෙයි.

© Prof. Nalin De Silva

අප රටේ ඇතැම් සෙල්ලිපිවල ඒ ඒ අය විසින් වෙහෙර විහාරවලට කරන ලද පූජා ගැන සඳහන්වන බවත් ඉන් එක් ආකාරයකින් ගත්කල මමත්වයක් ප්‍රදර්ශනය වන බවත් කලින් සඳහන්කෙරී ඇත. මමත්වය පිළිබඳ ප්‍රශ්නය කෙසේ වෙතත් ඒ සෙල්ලිපි ආශ්‍රයෙන් මෙරට සමාජ ජීවිතය ගැන ද යමක් සඳහන් කළහැකි ය. ඇතැම් සෙල්ලිපියක ඇත්තේ සෙනෙවියකුගේ බිරියක විසින් කරන ලද පූජා පිළිබඳ විස්තරයකි. උදාහරණයක් වශයෙන් දශමහා යෝධයන්ගෙන් ප්‍රධානියා යැයි සිතිය හැකි නන්දිමිත්‍ර සෙනෙවියන්ගේ භාර්යාව විසින් විහාරයකට කරන ලද පූජාවක් ගැන සඳහන් වෙයි.

එවැනි විස්තරවලින් පැහැදිලිවන්නේ එකල සෙනෙවියන් ඇතුළු ප්‍රභූන් යැයි සැලකිය හැකි පිරිස්වලට භාර්යාවක වශයෙන් හැඳින්වුණු කාන්තාවක සිටි බව ය. සාමාන්‍යයෙන් ගතහොත් පුරුෂයකුට භාර්යාවක් ද, භාර්යාවකට පුරුෂයකු ද සිටි බව ඉතිහාසයේ තොරතුරුවලින් අනාවරණය වන කරුණ ය. ඇතැම් පුරුෂයකු යම් ස්ත්‍රියක තම අඹුව කරගත්තා යැයි මිස අඹුවක කරගත්තා යැයි සාමාන්‍යයෙන් සඳහන් නො වෙයි. නුවර යුගයේ වුව ද එක්ගෙයි කෑමක් ගැන සඳහන්වන්නේ ඒ විශේෂයක් මිස සාමාන්‍යය නොවන බව දැනවෙන අයුරින් ය.

ඉතිහාසයේ සඳහන් තොරතුරු සකස්කර ගත්විට පෙනීයන්නේ සුවිශේෂ අවස්ථාවල හැරුණුකොට මෙරට ඒක භාර්යා ඒක පුරුෂ විවාහ ක්‍රමයක් තිබුණු බව ය. එකල මිනිසුන් විවාහ ලියාපදිංචි නොකරන්නට ඇත. එහෙත් ඉන් අදහස්කරන්නේ විවාහ නොතිබූ බව නො වේ. එකල විවාහ පමණක් නොව උපත් හා මරණ ද ලියාපදිංචි නොකෙරිණි. එහෙත් එපමණකින් එකල උපත් හා මරණ නොසිදුවිණි යැයි කියන්නකු සිටිය නො හැකි ය. වර්තමානයෙහි ඇතැමුන් බ්‍රිතාන්‍යයන් පැමිණීමට පෙර මෙරට ඉතා ලිහිල් ආවාහ විවාහ පද්ධතියක් තිබූ බවක් කියමින් වික්ටෝරියා කුහක සදාචාරයෙන් පිටමං වී නැවත ඒ පැරණි විවාහ ක්‍රමයට යා යුතු බවක් අඟවන්නේ පැරණි සිංහල සමාජය කෙරෙහි ඇති ගෞරවය හෝ වර්තමාන සිංහල සමාජය කෙරෙහි ඇති කරුණාව හෝ නිසා විය නොහැකි ය.

මහාචාර්ය නලින් ද සිල්වා

© Prof. Nalin De Silva